14 වන පිටුවෙන් (අදිසි)

"අයේෂ ඔයාව මුණ ගැහෙන්න ආව කියල මං දන්නවා අයෝමා.." රණසිංහ ගේ කලු ගැසුණ මුහුණ දෙස බලා සිටින අයෝමා සිනාසෙයි. අවිවේකය නිසා හෝ මානසික ආතතිය නිසා හෝ ඔහුගේ මුහුණ අඳුරු වී ඇතැයි අයෝමාට සිතෙයි.

ඩික්මන් පාරෙන් හැරුණ අතුරු මගක පිහිටි මේ ඉන්දියන් සුපිරි අවන් හල ජනාකීර්ණ තැනක් නොවේ. ඉඳ හිට හෝ ඇතුළට එන්නේ සාමාන්‍ය පන්තියේ අය නොවන බැවින් නිදහසේ කතා බහක නියැලෙන්නට කියාපු තැනකි. රණසිංහ අයෝමා සමගින් මෙහි පැමිණියේ එනිසා ය.

මෙහි සේවකයෝ රණසිංහ හොඳින් අඳුනති. කිසිවකුගෙන් අවහිරයක් නොවන අඳුරු මුල්ලක ඔහු වෙනුවෙන් මේසයක් වෙන් වන්නේ එබැවින් ය.

අයෝමා ඇඳ සිටියේ ඇඟටම හිරවන ඇඳුමකි. මේ ඇඳුමට ඇගේ රුව වඩාත් කැපී පෙනෙයි. එහෙත් මේ එවන් දේ පිලිබඳ සිත යෙදවිය හැකි වෙලාවක් නොවේ.

"අයේෂ ඔයාව මුණ ගැහෙන්න ආවා.." රණසිංහ නැවත කියයි.

"ඉතිං.." අයෝමා සිනාසෙයි.

"කෝ දැන් එයා...? අරහෙ අර මිනිස්සු මාව කන්න හදනවා දුව ගැන අහලා.."

"මොකද්ද ඇහුවෙ..? අයේෂ කෝ කියලා..?" අයෝමා ගේ මුහුණේ වූ සිනාව අතුරුදන් වන්නේ සැණකින් ය. ඕ තමා දෙස එබී බලන්නේ කෝපයෙන් යයි රණසිංහට සිතෙයි. ".. මොකද්ද රණසිංහ අයිය ඒ පාර පනින්න හදන පිම්ම..? ඔව්.. අයේෂ මාව හමුවෙන්න ආව තමයි.. ඔයාගෙ හපන්කම් ගැන ඔක්කොම කිව්ව තමයි.. මං ඒ කාරණේ ප්‍රඥාරත්න මහත්තයටත් කිව්ව තමයි.. ඒ ඔක්කොම ඇත්ත.. ඒත් අයේෂ කොහෙද කියන එක දන්නෙ මම නෙවෙයි ඔයා.."

රණසිංහ දෑතේම ඇඟිලි හිස කෙස් අතරින් යවමින් කල්පනාවට වැටී සිටියි. අයෝමා එය නොදුටුවා සේ දොඩම් වීදුරුව එක හුස්මට බී අවසන් කරයි.

"එතකොට ආයෝම කියන්නෙ අයේෂ කොහෙද කියල ඔයා දන්නෙ නැහැ කියලද..?"

"මං කොහොමද දන්නෙ..? අයේෂව හංගලා මට ලැබෙන ලාබෙ මොකද්ද..? මගේ මොළේ හොඳ නැති වෙලා කියලා හිතුව ද..?"

"මේක හරිම ප්‍රශ්නයක් වුණා නෙ දැං.."

"බොරුවට රඟපාන්න එපා රණසිංහ අයියා.." අයෝමා ගේ කටහඬෙහි ගැබ්ව ඇත්තේ අවඥාවකි. ".. ඔයාට ඕනෙ වුණා ඡන්දෙ ඉවර වෙනකල් මේ ප්‍රශ්නෙ යට ගහලා තියන්න.. ඒ නිසා ඔයා එයාව කොහේ හරි හැංගුවා.. මං පිළිගන්නවා ඒක හරිම ඥාණාන්විත පියවරක්... ඒකට මාත් එකඟයි.. ඒත් ඇයි දැන් ඒකට මාව ගාවන්න හදන්නෙ..?"

රණසිංහ පිළිතුරක් නොදී අයෝමා දෙස බලා සිටියි. ඔහුගේ නළල මත ඩා බිඳු නැගී ඇති සැටි අයෝමාට පෙනෙයි. අපූරුවට වායු සමනය කර ඇති මේ පරිසරයේ එය අසාමාන්‍ය දෙයකි. කල්පනාවකට වැටී සිටින ඔහුගේ මුහුණේ ඇඳී ඇති හැඟීම් තේරුම් ගන්නට අයෝමා උත්සාහ ගනියි.

ඔහු ඇගේ දෑස් මඟහැර ඇයට පිටුපසින් වූ ජනේලයෙන් පිටත බලයි. පිටත කුඩා මිදුලේ සිටවූ දිය බඳුනක් අතින් ගත් කාන්තාවගේ මූර්තිය ඔහුට පෙනෙයි. ඒ බඳුනින් නොකඩවා දිය දහරක් ගලා එයි. ඒ දිය වැටෙන්නේ පහළ ඇති දිය තටාකයට බව ඔහු දනියි. දිය වැටෙන හඬ මෙතැනට නෑසෙයි. බොහෝ වේලාවකට පසු රණසිංහ නිහඬතාව බිඳියි.

"මෙතන දැන් රඟපෑම කරන්නෙ ඔයාද මමද කියලා මට තේරුම් ගන්න බැහැ නංගි.."

00000

හීල් දානය ගෙනෙන්ට අවශ්‍ය බඳුන් ගෙන යාමට ආ තරුණියත් ඇගේ තනියට ආ දරුවාත් මහ ගේට්ටුවෙන් පිටව යන සැටි බුදු මැඳුර ඉදිරියේ සිටගෙන සිටින පොඩි හාමුදුරුවන්ට පෙනෙයි.

සෙදෝරිස් සුපුරුදු ලෙසම මිදුල අමදියි. වැලි මිදුලේ ඇඳී ඇති ජිනරතන හාමුදුරුවන් ආ බෙන්ස් රියේ රෝද සටහන් ඔහුගේ ඉදලින් මැකී යමින් තිබෙයි. ලොකු හාමුදුරුවන් හා සතරකන් මන්ත්‍රණයක යෙදුණ ජිනරතන හාමුදුරුවන් ආපසු ගියේ නොපහන් සිතකින් බව පොඩි හාමුදුරුවෝ දනිති.

හෙට පැවැත්වෙන රණසිංහ ගේ මැතිවරණ ව්‍යාපාරයේ අවසන් මහා රැස්වීමට ලොකු හාමුදුරුවන් වඩිනු ඇතැයි යන ආරංචිය ජිනරතන හාමුදුරුවන් ගේ කණටද වැටෙන්නට ඇති බව නිසැක ය. තකහනියක් ලොකු හාමුදරුවන් සොයා වඩින්නට උන්වහන්සේට සිතෙන්නට ඇත්තේ එනිසා ය. හාමුදුරුවරුන් ගේ පක්ෂයේ ඡන්දාපේක්ෂකයකු වන ලෙස ලොකු හාමුදුරුවන්ගෙන් කළ ඉල්ලීම ඉටු නොවූ දා සිට ම ජිනරතන හාමුදරුවන් මේ පැත්ත පළාතේ නොවැඩි බව පොඩි හාමුදුරුවෝ දනිති.

සෙදෝරිස් හදිසියේම අතු ගෑම නවත්වා පොඩි හාමුදුරුවන් දෙස බලයි.

"අපේ ලොකු හාමුදුරුවන්ටත් තියෙන්නෙ බෙන්ස් එකක් අරගන්න.."

"ඒ මොකටද සෙදෝරිස්...?"

"එහෙම නැතුව නම් අපේ ලොකු හාමුදුරුවන්ට මේ බෙන්ස් හාමුදුරුවරුන්ගෙන් බේරිලා ඉන්ඩ බැරි වෙයි.. නිවන් මග හොයන්ඩ කලියෙන් බේරගන්ඩ කොයි තරම් නම් ගනු දෙනු මේ හාමුදුරුවන්ට තියෙනවද..?"

"ඉතිං..?"

"වැල යන අතට මැස්ස ගහන්ඩ ඕනෙ අපේ හාමුදුරුවනේ.."

පොඩි හාමුදුරුවන් බුදු ගෙයට ගොඩ වන්නේ සිත යටින් සිනාසෙමිනි. පන්සලක හැදුනද මේ ගෙන්දගම් පොළොවේ අව සියවසක් ජීවත් වූ සෙදෝරිස් මෝඩයෙක් නොවේ. ඈත සිට සියල්ල බලා සිටිනා මේ වයෝවෘධ මිනිසාට වැටහෙන සත්‍යය තේරුම් ගත හැකි අය තව කොපමණ සිටිත්දැයි පොඩි හාමුදුරුවන් නොදනී.

බුදු මැදුරේ සුවිසල් පිළිමය ඉදිරියේ වාඩි වන පොඩි හාමුදුරුවෝ අනිමිස ලෝචනයෙන් ඒ දෙස බලා සිටිති. සිත බාහිර ලෝකයෙන් ඉවත් කර ගන්නට උන් වහන්සේට ගත වන්නේ ඉතා කෙටි කාලයකි. සියල්ල කිසියම් රටාවකට සිදුවෙමින් පවතියි. මේ ප්‍රවාහයට අසු නොවී සිටින්නට තමන්ට හැකි බව උන්වහන්සේට විශ්වාස ය. තමා පමණක් මෙයින් ගැලවී සිටීමට උත්සාහ කිරීම ආත්මාර්ථකාමය නොවන්නේ ද? පොඩි හාමුදුරුවන්ට වටහා ගත නොහැක්කේ ඒ පැනයට සුදුසු පිලිතුරකි.

*මීළඟ කළාපයට*

